# ජනාධිපතිවරණය

ජනාධිපතිවරණය ලබන වසරේ නොව මෙම වසරේ ම පැවැත්වෙන බවට සංඥා ලැබෙමින් පවතියි. මහින්ද රාජපක්ෂ මහතා ශ්‍රී ල නි ප ජනාධිපතිවරණ අපේක්ෂයා ලෙස තෝරාගනු ලැබීම ඒ එක් සංඥාවක් වුව ද ඒ ප්‍රධාන සංඥාව නො වෙයි. මෙහි දී අපට වඩා වැදගත්වන්නේ මැතිවරණ කොමසාරිස්වරයා ඉදිරිපත්කරන මතය ය. ඒ මහතා පසුගිය දිනෙක කලාතුරකින් කරන පුවත්පත් සාකච්ඡාවක් ඔස්සේ පාඨකයන්ට ඒ පිළිබඳ යම් ඉඟියක් කර තිබුණි. ඒ ඉඟිය, අප තේරුම්ගන්නා ආකාරයෙන් නම්, මේ වසර අවසන්වීමට පෙර ජනාධිපතිවරණයක් පැවැත්වීම පිළිබඳ ව ය. ව්‍යවස්ථාව අනුව කුමාරතුංග මහත්මියට 2006 දක්වා ජනාධිපතිනිය ලෙස කටයුතුකිරීමේ ඉඩක් ඇත. එහෙත් ඒ සුදුසු ආකාරයකට දිවුරුම් දී ඇත්නම් ය. කුමාරතුංග මහත්මිය තමා දෙවන වතාවේ ජනාධිපතිනිය ලෙස ජයග්‍රහණයකිරීමෙන් පසුව දිවුරුම්දීම පළමුවාරය අවසන්වන තෙක් කල්දැමුවේ නම් ඇයට ලබන වසර අවසන දක්වා ජනාධිපතිනිය ලෙස කටයුතුකිරීමට ඉඩ තිබුණි. බටහිර න්‍යාය අනුව කෙසේවත් පළමුවාරයත් දෙවැනිවාරයත් සමගාමීව ගෙවී නොයයි. දෙවැනි වාරය සඳහා දිවුරුම් දීමත් සමග පළමුවාරය අවසන් වෙයි. පළමුවාරය අවසන්වීමට පෙර දෙවැනිවාරයක් සඳහා ජනාධිපතිවරණයක් පැවැත්වීමට පළමු පත්වීමෙන් අවුරුදු හතරකට පසුව ජනාධිපතිවරයකුට ව්‍යවස්ථාවෙන් ඉඩකඩ ඇති නමුත් යම් අයුරකින් එසේ දෙවැනිවර පත්වුවහොත් ඒ දෙවැනි වාරය පටන්ගැනෙන්නේ දෙවැනිවාරය සඳහා දිවුරුම් දුන් දිනයේ සිට ය. එලෙස දිවුරුම් දීමෙන් පසුව තවත් වරක් හෝ කිහිපවරක් වුවත් දිවුරුම් දිය හැකි වුවත් ඒ පසුව කරන දිවුරුම්දීම්වලින් ඵලක් නො වේ. කිසිවකුට එකම තනතුරක වැඩ කිහිප විටක් භාරගත නො හැකි ය.

ශ්‍රී ල නි ප ඒ බව දැන හෝ වෙනත් හේතුවක් නිසා හෝ මහින්ද රාජපක්ෂ මහතා පක්ෂයෙහි ජනාධිපති අපේක්ෂකයා ලෙස නම්කර ඇත. එහි ගැටළුවක් නොමැත. එහෙත් ප්‍රශ්නය වනුයේ අනුර බණ්ඩාරනායක මහතා අගමැති අපේක්ෂකයා ලෙස නම්කෙළේ ඇයි ද යන්න ය. ජනාධිපතිවරණය සමග පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමේ අදහසක් ජනාධිපතිනියට වේ ද? එසේ නොවේ නම් අගමැති අපේක්ෂකයකු නම්කිරීම මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන ජීවිතයට තර්ජනයක් වෙයි. යම් හෙයකින් ජනාධිපතිවරණයෙන් රාජපක්ෂ මහතා පරාජය වුවහොත් රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති වී කුමක් කරනු ඇත් ද? ඒ මහතාට එහි දී විකල්ප තුනක් තිබේ. ඒ කරු ජයසූරිය මහතා අගමැති ලෙස පත්කර ආණ්ඩුවක් පිහිටුවීම ය. එහෙත් ඒ සඳහා අවශ්‍ය බහුතරය පාර්ලිමේන්තුවේ දී එ ජා පක්ෂයට ලැබේ දැයි යන්න සැකසහිත ය. දෙවනුව ඒ මහතාට ශ්‍රී ල නි පක්ෂයට ම ආණ්ඩුව පවත්වාගෙන යෑමට ඉල්ලීමට හැකි ය. එහි දී ඔහු අගමැති වශයෙන් පත්කරනු ඇත්තේ ඒ පක්ෂයෙහි අගමැති අපේක්ෂකයා වූ අනුර බණ්ඩාරනායක මහතා ය. තුන්වැනුව වික්‍රමසිංහ මහතාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි ය. එවිට ද මැතිවරණයේ දී අගමැති අපේක්ෂකයා වනුයේ බණ්ඩාරනායක මහතා ය. බණ්ඩාරනායක මහතා එහි ප්‍රතිඵලයක් ලෙස එක්කෝ අගමැති වනු ඇත. නැත්නම් විපක්ෂ නායක වනු ඇත. එවිට රාජපක්ෂ මහතාට හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු වීමට වඩා ඉහළට යෑමේ අවස්ථාවක් නොලැබීමට ඇති ඉඩකඩ අධික ය.

රාජපක්ෂ මහතා බල දේශපාලනයේ රැඳී සිටීමට නම් වසර අවසන පැවැත්වෙන ජනාධිපතිවරයෙන් ජයගත යුතු ම ය. නැතහොත් ඒ මහතා බල දේශපාලනයෙන් ඉවත්කෙරෙනු ඇත. මින් මතු පැවැත්වෙන ජනාධිපතිවරණයක දී ශ්‍රී ල නි ප ජනාධිපති අපේක්ෂක වීමට අනුර බණ්ඩාරනායක මහතාට හැකි වීම එහි අවසාන ප්‍රතිඵලය වනු ඇත. මේ සියල්ල තවත් දේශපාලන ගැටයක් ද යන ප්‍රශ්නය මතුවෙයි. ඇතැම් පවුල්වලින් හා ඇතැම් ප්‍රදේශවලින් එන අයට පමණක් මෙරට නායකත්වය හිමිවන බව කුමාරතුංග මහත්මිය කීවේ මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති අපේක්ෂකයා ලෙස නම්කිරීමට දින දෙකකට කලින් ය. පන්සල් ගිය පමණින් නායකයන් නොවන බව ද ඒ මහත්මිය සඳහන් කළා ය. එසේ නම් හදිසියේම රුහුණු පුත්‍රයකු ජනාධිපති අපේක්ෂක ලෙස නම්කිරීමට ඒ මහත්මිය තීරණය කෙළේ ජනාධිපති අපේක්ෂක වීම හා ජනාධිපතිවීම එකක් නොව දෙකක් බව ඒ මහත්මිය දන්නා නිසා ද? අනෙක් අතට ජනාධිපතිවරණය මෙහෙයවීම ඇයට පවරාගත්තේ ඇයි? රාජපක්ෂ මහතා ජනාධිපති අපේක්ෂකයා ලෙස නම් කෙළේ කපන්න බැරි අත සිඹීමට වඩා සිඹිමින් අත කැපීමට ද?

© Prof. Nalin De Silva

කුමාරතුංග මහත්මිය ශ්‍රී ල නි පක්‍ෂයේ යාවජීව නායිකාව වන බවට ද රාවයක් ඇත. එමෙන් ම ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස්කිරීම ද ඇයට හිමිවෙයි. ශ්‍රී ල නි ප අත්හැර තම සැමියා සමග සිංහල විරෝධී මහජන පක්‍ෂයක් පිහිටුවමින් ශ්‍රී ල නි පක්‍ෂයට විරුද්ධ වූ අයකු එහි යාවජීව නායිකාව කරගැනීමට පක්‍ෂයට අවශ්‍ය ද? ලංඩනයේ සිටි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ආපසු ලංකාවට ගෙන්වූවෝ මූලික වශයෙන් සිංහල විරෝධී වූවෝ ය. ඔවුන් අතර සති අන්ත පත්තර කඩමාල්ලක කතුවරයකු දත් දොස්තර කෙනකු ආදීහු වූහ. විජාතික බලවේගවලට අවශ්‍ය වුයේ කුමාරතුග මහත්මිය ලවා ශ්‍රී ල නි ප ඔස්සේ දෙමළ ජාතිවාදයට සහසන්ධීය රාජ්‍යයක් ලබාදීම ය. ශ්‍රී ල නි ප ගසා කා එය මහජන පක්‍ෂයක් බවට පත්කල කුමාරතුංග මහත්මිය අවසානයේ දී සුසාන මණ්ඩල පිහිටුවා දෙමළ ජාතිවාදීන්ට පසුකලක දෙමළ ඊළම ප්‍රකාශකිරීමේ දී යොදාගත හැකි ලියවිල්ලක් සකස්කර දුන්නා ය. විජාතික බලවේග තවදුරටත් ඇගෙන් යමක් බලාපොරොත්තු නො වෙයි. ඇය ආපසු ලංඩනයට යැවීම හැරෙන්නට වෙනත් විකල්පයක් නැත. ඇය යාවජීව නායිකාව බවට පත්වීමේ වෑයම පරාජය කළ යුතු වෙයි. ඇගේ ප්‍රධානත්වයෙන් සකස්වෙන ප්‍රතිපත්ති ප්‍රකාශනයක දෙමළ ජාතිවාදයට කුමක් ලබාදෙන්නේ දැයි වක්‍ර ආකාරයකින් සඳහන්වනු ඇත. රාජපක්‍ෂ මහතාට පැරදී දේශපාලනයෙන් ඉවත්වීමට අවශ්‍ය නම් කළ යුත්තේ කුමාරතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් සකස්වෙන ප්‍රතිපත්ති ප්‍රකාශනයක් මත ජනාධිපතිවරණයට ඉදිරිපත්වීම ය.

රාජපක්‍ෂ මහතාට දිනිය හැක්කේ කෙසේ ද? ඒ අන්කිසි ආකාරයකින් නොව මහජන පක්‍ෂයක් බවට පත් වී ඇති ශ්‍රී ල නි ප, නැවතත් ශ්‍රී ල නි පක්‍ෂය බවට පත්කිරීමෙන් ය. එහෙත් රාජපක්‍ෂ මහතා ඒ කරන්නේ කෙසේ ද? ඒ මහතා වටා එක්රොක් වූ රාජ්‍ය නොවන සංවිධානවල ගැත්තෝ වෙති. ඔවුන් දැනටමත් ඒ මහතාට ලණු දෙන බව නිසැක ය. දෙමළ ජනතාවගේ ඡන්ද නොමැතිව දිනීමට නොහැකි බවත් ඒ නිසා දෙමළ ජාතිවාදයට කප්පම් දිය යුතු බවත් ඔවුන් සඳහන් කරනු ඇත. දෙමළ ජාතිවාදය යනු පළමුව ලන්දේසින්ගේ හා පසුව බ්‍රිතානීන්ගේ නිර්මාණයක් හා හදාවඩා ගැනීමකි. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම වූ ප්‍රශ්නයක් මෙරට නැත. තමා මහා වාමාංශිකයකු  ලෙස පෙනී සිටීමට යත්න දරන කසිකබල් පශ්චාත් මාක්ස්වාදියකු පසුගියදා පත්තර කඩමාල්ලක දෙමළ ජනයාට 1983 දී වූ සිද්ධියක් ගැන කියමින් ඒ දෙමළ ජනයාට දෙමළ නිසා ම වූ ප්‍රශ්නයක් නොවේ දැයි අසා තිබුණි. මේ ව්‍යාජ බුද්ධිමතා දන්නා දෙයක් නැත. ඔහු වරක් කියා තිබුනේ මගේ දරුවන්ට සිංහල බැරිය කියා ය. මගේ කිසිම දරුවකු මොහු ලියන හඩු සිංහල ලියන්නේ නැත. මගේ දරුවන් සමග මා කිසි දිනෙක වචනයක්වත් ඉංගිරිසියෙන් කතාකර නැත. අපේ ගෙදර භාවිතාවන එකම භාෂාව සිංහල ය. කෙසේ හෝ මේ ව්‍යාජ උගතාට අනුව කොළඃඹ විශ්ව විද්‍යාලයේ කළමනාකාර පීඨයේ සිසුන් ශාස්ත්‍ර පීඨයේ සිසුන් සමග ඉදහිට ගැටුනහොත් ඉන් කියැවෙන්නේ එක් පීඨයක සිසුන්ට ඒ පීඨයේ සිසුන්වීම නිසා ම ප්‍රශ්නයක් ඇති බව ය. මේ ව්‍යාජ උගතාට නොපෙනෙන කරුණ නම් දෙමළ මෙන් ම මුස්ලිම් ජනයාට කොළඹ හා වෙනත් නගරවල වාසය කළ හැකි වුව ද සිංහලයන්ට සිංහල වීම නිසා ම යාපනයේ වාසය කිරීමට නො හැකි බවත් ඒ ඉදහිට පමණක් සිදුවන දෙයක් නොවන බවත් ය.

දෙමළ ජාතිවාදයට කප්පම් නොදී ජනාධිපතිවරණය දිනිය හැකි ය. ඒ ජාතිකත්ව පදනමකින් ය. පසුගිය මැතිවරණයේ දී සංධානය ජයගත්තේ මුළුමනින් ම මෙන් සිංහලයන්ගේ ඡන්දවලින් ය. අද ලංකාවේ ජනගනයෙන් 80% ක් පමණ සිංහලයෝ වෙති. එ ජා පයට සිංහලයන්ගෙන් 35%ක පමණ නිත්‍ය ඡන්දයක් වෙයි. පාවෙන ඡන්ද ඇතුළු ඉතිරි ඡන්ද 65% ම රාජපක්‍ෂ මහතාට ගතහැකි නම් මුළු ඡන්දයෙන් 50%ක් හා එක් ඡන්දයක් ලබාගැනීම අසීරු කරුණක් නො වේ. ඒ අතර සුනාමියෙන් පසු, කොටි විරෝධී මුස්ලිම් ඡන්ද රාශියක් ද ඒ මහතාට ලැබෙනු ඇත. එ ජා පයට 40% නිත්‍ය ඡන්දයක් තිබෙන්නේ යැයි උපකල්පනය කළ ද, ජාතික හෙළ උරුමය තමන්ගේ අපේක්‍ෂකයකු ඉදිරිපත්කළ ද, මුස්ලිම් ඡන්ද සමග රාජපක්‍ෂ මහතාට ජයග්‍රහණය කළ හැකි ය. ජා හෙ උරුමයට පසුගිය මැතිවරණයේ දී ලැබුණු ඡන්ද විශාල ප්‍රමාණයක් ආපසු එ ජා පක්‍ෂයට යනු ඇත. රාජපක්‍ෂ මහතාට එලෙස ජයග්‍රහණය කළ හැක්කේ කුමාරතුංග මහත්මියගේ හෝ රාජ්‍ය නොවන බැලයන්ගේ හෝ ප්‍රතිපත්ති මත පිහිටා නො වේ. රාජපක්‍ෂ මහතා වහාම මේ බැලයන්ගෙන් නිදහස් වී පණස් හයේ පෙරළියේ පණස්වස සැමරීමට ආසන්නයේදී නැවතත් සිංහල මරික්කාර්ලා සමග ජාතිකත්වය මත ශ්‍රී ල නි ප සංවිධානයකර වෙනත් ජාතිකමත දරණ පක්‍ෂ සමග නව සංධානයක් ගොඩනැගිය යුතු ය. ජ වි පෙ මේ සංධානයේ සාමාජිකයකුවීම අත්‍යවශ්‍ය වෙයි. එයට විරුද්ධවන්නන් ශ්‍රී ල නි පක්‍ෂයෙහි මෙන්ම ජ වි පෙරමුණෙහි ද සිටීමට හැකි ය. විශේෂයෙන්ම ජ වි පෙට සම්පවී ඇති ඇතැමුන් තමන් සේවය කරන බටහිර ස්වාමීන්ගේ අවශ්‍යතාව පිරිදි ද, ඇතැමුන් ශ්‍රී ල නි ප කෙරෙහි ඇති වෛරය ද හේතුකොටගෙන එයට විරුද්ධ වනු ඇත. එහෙත් එවැන්නන් පරාජයකිරීම අපහසු කාර්යයක් නොවිය යුතු ය.

© Prof. Nalin De Silva